# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ    அதிவிசேஷமானது    EXTRAORDINARY

අංක 948 / 24 - 1996 නොවැම්බර් 07 වැනි බ්‍රහස්පතින්දා - 1996.11.07

*948/24 ஆம் இலக்கம் - 1996 ஆம் ஆண்டு நவெம்பர் மாதம் 07 ஆம் திகதி வியாழக்கிழமை*

No. 948/24 – THURSDAY, NOVEMBER 07, 1996

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)   *(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)*   (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ජේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 59/41 II.

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 64 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ඉන්දික රූපසිංහ ගුණවර්ධන,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1996 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1980 ඔක්තෝබර් මස 03 වැනි දින අංක 109 දරන **ගැසට් පත්‍රයේ** පළ කරන ලද 1980 ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම පිළිබඳ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 6 (1) වන නියෝගයේ "ලියාපදිංචි කිරීමේ අංකයන් අනුක්‍රමිකාංක '1ධී' වශයෙන් පටන් ගෙන '2ධී', '3ධී' යනාදි වශයෙන් ලියාගෙන යා යුතුය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ලියාපදිංචි කිරීමේ අංකයන් අනුක්‍රමිකාංක '1' වශයෙන් පටන් ගෙන '2', '3' යනාදී වශයෙන් ලියාගෙන යා යුතුය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි 6 වන නියෝගයේ (2) වන ජේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන්:-

"(2) ධීවර බෝට්ටුවක් වශයෙන් ලියාපදිංචි කරන ලද බෝට්ටුවකට ලියාපදිංචි කිරීමේ අංකය වෙන් කළ විට, බෝට්ටුව අයත් ප්‍රදේශය හැඳින්වෙන පහත දැක්වෙන සංකේත අකුරු ද ලියාපදිංචි කළ අංකයේ අගට එකතු කළ යුතුය. එසේම සියළු


1 A – D 042271 – 1,960 (96/11)

බෝට්ටුවල සංකේත අකුරු සහ ලියාපදිංචි කළ අංකය අඟල් 6 උස ඝන අකුරු සහ ඉලක්කම්වලින් පත්තාරය උඩ හෝ ඉදිරි පත්ඇණියේ ඉහළ පැහැදිලිව පෙනෙන සේ කලු පැහැයෙන් පින්තාරු කළ යුතුය:–

| *දිස්ත්‍රික්කය/කොට්ඨාශය* | *සංකේත අකුරු* |
|---|---|
| මීගමුව | NBO |
| කොළඹ | CBO |
| කළුතර | KLT |
| ගාල්ල | GLE |
| මාතර | MTR |
| තංගල්ල | TLE |
| මඩකලපුව | BCO |
| ත්‍රිකුණාමලය | TCO |
| මුලතිව් | MLT |
| කල්මුනේ | KMN |
| යාපනය | JFN |
| මන්නාරම | MNR |
| පුත්තලම | PTM |
| හලාවත | CHW |
| කිලිනොච්චි | KCH |
| අනුරාධපුරය | ANP |
| බදුල්ල | BDL |
| මොණරාගල | MRG |
| රත්නපුරය | RNP |
| පොළොන්නරුව | PLN |
| මහනුවර | KND |
| කෑගල්ල | KGL |
| නුවරඑළිය | NEL |
| කුරුණෑගල | KNG |
| මාතලේ | MTL |
| වවුනියාව | VVN."; |

(3) එහි 7 වන නියෝගයේ (2) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:–

"(2) යාන්ත්‍රික බෝට්ටුවක නම් පිට පෝරුවට අඟල් 6ක් පහළින් හා ඇණියේ ඉදිරිපස කෙළවරේ සිට අඩියක දුර ප්‍රමාණයකින් එහි පිටත දෙපැත්තේ ද, පිට පෝරුවක් සහිත යාන්ත්‍රික නොවන බෝට්ටුවක නම්, එහි පිට පෝරුවට අඟල් 6ක් පහළින් හා ඇණියේ ඉදිරිපස කෙළවරේ සිට අඩියක දුර ප්‍රමාණයෙන් එහි පිටත දෙපැත්තේ ද, පිට පෝරුවක් රහිත යාන්ත්‍රික නොවන බෝට්ටුවක නම් එහි ඇණියේ ඉදිරිපස කෙළවරේ සිට අඩියක දුර ප්‍රමාණයකින් එහි පිටත දෙපැත්තේ ද අඟල් 6ක් උස ඉලක්කම් හා අකුරු සුදු පැහැයෙන් පින්තාරු කරන ලද නාමපුවරුවක් සවි කළයුතුය.";

(4) එහි (7) වන නියෝගයේ (3) වන ඡේදයේ "කලු පැහැයෙන්" යන වචන වෙනුවට "සුදු පැහැයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි 8 වන නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන නව නියෝගය ආදේශ කිරීමෙන්:–

"8 මෙම නියෝග යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ දින සිට වර්ෂයක කාලයක් සඳහා වලංගු වන අතර වාර්ෂිකව එය අලුත් කරනු ලැබිය යුතුය. වලංගු කාලය ඉකුත් වීමට යටත් පිරිසෙයින් දින 15කට පෙර මෙම අලුත් කිරීම කළ යුතුය. වලංගු රක්ෂණ සහතිකයක් ද, පවත්නා ලියාපදිංචි කිරීමේ සහතිකය සහ මුහුදු ගමන් යෝග්‍යතා සහතිකය ද ප්‍රදේශයේ ධීවර පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් සහ මෙහි දෙවන උපලේඛනයේ (ආ) ලැයිස්තුවේ දක්වා ඇති අදාළ ගාස්තු ගෙවීමෙන් ද ලියාපදිංචි කිරීම, එසේ අලුත් කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.";

(6) එහි 14 වන නියෝගයේ (2) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(3) හිතාමතාම වැරදි ලියාපදිංචි අංකයක් බෝට්ටුවක ප්‍රදර්ශනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.";

(7) එහි දෙවන උපලේඛනයේ "නව ක්‍රමය යටතේ මිරිදිය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම" යන ඡේදය ඉවත් කිරීමෙන්.

2. 1996 මාර්තු 20 වන දින අංක 915/8 දරන **ගැසට් පත්‍රයේ** පළ කරන ලද නියෝගය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

11-542